ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
President of Sri Lanka

# හජ් පණිවිඩය

හජ් සමය ලොව පුරා වෙසෙන ඉස්ලාම් බැතිමතුන් අතර අන්‍යෝන්‍ය අවබෝධය, සෙනෙහස සහ සමාචාර චතාවත් ඉහළින් පිළිබිඹු කෙරෙන අධ්‍යාත්මික උළෙලකි. එය ඉස්ලාම් සමාජය අනාගත පරපුරට සංස්කෘතිය පවරා දෙන සුවිශේෂී කාලපරිච්ඡේදයක් ලෙස ද මම දකිමි.

සියලු ආගම්වලට අයත් ශාස්තෘවරුන් මානව යහපැවැත්මට අවශ්‍ය ලෝකාර්ථ ධර්ම පෙන්වා දී තිබේ. එමගින් සමාජ සාරාර්ථ ශක්තිමත් කර අන්‍යෝන්‍ය සබඳතා ගොඩනැගීමට ලබා දෙන දායකත්වය අගණේය. එය ලෝක යහපැවැත්මට සහ අඛණ්ඩතාවට අත්‍යාවශ්‍ය සාධකයකි.

ඉස්ලාමීය දහමේ අවසාන ශාස්තෘවරයා ලෙස සැළකෙන මුහම්මද් නබිතුමන්ගේ ජීවිතාදර්ශය අදටත් අනුගමනය කරන ඉස්ලාමීය අනුගාමික සියලු දෙනා අපේක්ෂා කරන දෙලොව ජයග්‍රහණය සහ දිව්‍යමය සම්පතාව උදාකර ගැනීමට මෙම කාලය උපකාරී වනු ඇත.

කොවිඩ් වසංගතය හේතුවෙන් සම්ප්‍රදායික ඇදහිලි සහ විශ්වාසයන්ට පෙර පරිදි කටයුතු කිරීමට යම් සීමාවන් පනවා තිබේ. ඒ සියලු දෙනාගේ ආරක්ෂාව සහ සමාජ සුභසිද්ධිය පිණිසය. ඒ පිළිබඳ විශේෂ අවධානය යොමු කර මේ ඉස්ලාම් සමය චතාවත්වල නිරතවෙමින් කටයුතු කරන ලෙස සිහිපත් කරමි.

ශුද්ධ කුරානය සහ මුහම්මද් නබිතුමාගේ ජීවන දර්ශනය අනුව යන ඉස්ලාමීය බැතිමත් ඔබට දිව්‍යමය සම්පතාව සහිත අධ්‍යාත්මික විමුක්තිය හජ් යාඥාවෙන් සාක්ෂාත් වන මංගල්‍යයක් වේවා යි ප්‍රාර්ථනා කරමි.

ගෝඨාභය රාජපක්ෂ

2021 ජූලි මස 20 වන දින